විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 09/2015 (සංශෝධන V)

මගේ අංක : විවැ/චක්‍රලේඛ 2023
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2023.12.01

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / ත්‍රිවිධ හමුදාධිපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**2016.01.01 දිනෙන් පසු රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලබා සේවයේ යෙදී සිටිය දී මියගිය නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂිකය හිමි ගැන්වීම**

2016.01.01 දිනට පසුව රාජ්‍ය සේවයේ පත්වීම් ලබා ඇති මේ වනවිට සේවයේ යෙදී සිටිය දී මියගොස් ඇති හා යම් හෙයකින් ඉදිරියේ දී නිලධාරියෙකු සේවයේ යෙදී සිටිය දී මියගියහොත් එම මිය යන නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2ආ (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මරණ පාරිතෝෂික හිමිකම ලබා දීම සඳහා අනුමැතිය ලබාදීමට 2023.11.06 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. මෙම විධිවිධාන ක්‍රියාත්මක වනුයේ "ජාතික දායකත්ව විශ්‍රාම අරමුදල් පනත" බලාත්මක වනතෙක් පමණි.

03. ඒ අනුව 2016.01.01 දිනට පසු රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලබා සේවයේ යෙදී සිටිය දී මියගිය නිලධාරීන්ගේ යැපෙන්නන් හට මරණ පාරිතෝෂිකය ලබාදීම සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2015 හා 09/2015 (සංශෝධන III) ප්‍රකාරව මාර්ගගත දත්ත පද්ධතිය ඔස්සේ මරණ පාරිතෝෂික අයදුම්පත (PD 5) පහත සඳහන් ලේඛන සමඟ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු ය.

මිය ගිය නිලධාරියාගේ,

i. මරණ සහතිකයේ මුල් පිටපත
ii. උප්පැන්න සහතිකයේ මුල් පිටපත
iii. ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපතක්
iv. වර්යා සටහනෙහි සහතික කළ පිටපතක්
v. අවසන් වරට ලබාගත් වැටුප් වාර්තාවේ සහතික කළ පිටපතක්
vi. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව වැටුප් පරිවර්තන ලිපිය
vii. සියලුම යැපෙන්නන්ගේ බැංකු ගිණුම් පොත්වල සහතික කළ පිටපත්

viii. දායකයා මිය යන අවස්ථාවේ දී ඔහුගෙන් යැපුණු නීත්‍යානුකූල යැපෙන්නන් පිළිබඳ වාර්තාව (ප්‍රාදේශීය ලේකම් සහතික කළ) යැපෙන්නන් රැකියාවක් කරයි නම් රැකියාවේ නිරත වූ දිනය, විවාහක නම් විවාහ වූ දිනය ඇතුලත් කරන්න.

ix. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 06/2015 (සංශෝධන I) අනුව සම්පූර්ණ කරන ලද PD 4 ආකෘති පත්‍රය හා අදාළ ලේඛන

04. ඉහත සඳහන් මිය ගිය රාජ්‍ය නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂිකය හිමි ගැන්වීම කඩිනමින් සිදු කිරීම සඳහා ඔබගේ සහයෝගය අපේක්ෂා කරමි.

**ඒ. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

| | | |
|---|---|---|
| 1. ජනාධිපති ලේකම් | - | කාරුණික දැනගැනීම සඳහා |
| 2. අග්‍රාමාත්‍ය ලේකම් | - | කාරුණික දැනගැනීම සඳහා |
| 3. අමාත්‍ය මණ්ඩල ලේකම් | - | කාරුණික දැනගැනීම සඳහා |
| 4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - | කාරුණික දැනගැනීම සඳහා |
| 5. විගණකාධිපති | - | අවශ්‍ය කටයුතු සඳහා |